# ඒ දමනය කළ සිත..



**ගිණිගෙන දැවෙන පූජනීය තිච් ක්වන්ග් ඩක් නාහිමිපාණන්ගේ සිරුර**

**වි**යට්නාම් යුද්ධයේදී ඇමරිකානු ත්‍රස්තවාදයට සහ ඇමරිකානු භීෂණයට එරෙහිව ලෝක ජන මතයක් ගොඩනැගීම උදෙසා, වියට්නාම් ජාතික බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් වූ **"තිච් ක්වන්ග් ඩක්"** නාහිමිපාණෝ, (Most Venerable **Thich Quang Duc** Nayaka Thera) **1963 ජුනි 11 දා** වියට්නාමයේ සයිගොන් නුවර ප්‍රධාන වීදියකදී (වර්තමානයේ Nguyen Dinh Chieu & Cach Mang Thang Tam Street) මේ ආකාරයට තම සිරුරට ගිනි තබාගෙන අභය චිත්තාවෙන් අපවත් වූහ.

පෞද්ගලික අභිලාෂයන්ගෙන්ද, පෞද්ගලික අපේක්ෂාවන්ගෙන්ද ඔබ්බට විහිදීගිය මනසකින් යුතුව, අප්‍රමාණ වද වේදනාවන්ටත්, කෲරතර ඝාතන වලටත් ලක්වන වියට්නාම් ජනතාව වෙත පැතිරුණු මහා පරාර්ථකාමී සිතුවිල්ලද, චිත්ත ඒකාග්‍රතාවයේ අසමාන ශක්තියද පදනම් කොටගත් මෙම අසාමාන්‍ය සිදුවීම, බටහිර මතවාදයන් උඩුයටිකුරු කළාවූද, විශ්මයට පත්කළාවූද අවස්ථාවක් විය.

භාවනානුයෝගී පද්මාසන ඉරියව්වෙන් බිම වාඩිවී සිය සිරුරට ගිනි තබාගත් පූජනීය වූ තිච් ක්වන්ග් ඩක් නාහිමිපාණන් වහන්සේ තම සිරුර සම්පූර්ණයෙන්ම දැවී අඟුරු බවට පත්වී පොළොවට ඇදවැටෙන මොහොත දක්වාම, වචනාර්ථයෙන්ම දශමයක්වත් නොසෙල්වී සිටීමට තරම් දමනය කළ සිතකින් පසුවූ බව ඒ මොහොත සියැසින් දුටු දහසක් දෙනා සාක්ෂි සපයයි.

තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ දර්ශනයෙහි පැහැදිලි කරන අභය චිත්තය, බියට හා ත්‍රස්තවාදයට ප්‍රතිපක්ෂ වූ නිර්භීතකම නොවේ. භය නොහඳුනන, එහෙයින්ම එය නොදැනෙන්නාවූ තත්වයයි. සංවෘත වූ නමුදු නොකිළිටි වූ මනසයි.

**සුවහසක් මිනිසුන්ගේ හිතසුව පිණිස මනස මෙහෙයවූ අති පූජනීය වූ තිච් ක්වන්ග් ඩක් නාහිමිපාණන් වහන්සේගේ දමනය කළ සිත වත්මන් ලෝකයටම දැවැන්ත ඉගැන්වීමක් වේවා.!**

ලාල් හෑගොඩ මහතාගේ ලිපියක් ඇසුරෙනි. ජායාරූපය : මැල්කම් බ්‍රවුන්

ඔබ සතුව මේ සිදුවීම පිළිබඳ තවත් තොරතුරු ඇත්නම් කරුණාකර දන්වන්න

realitynature@gmail.com



# වියට්නාම් ජාතික අතිපූජනීය තිච් ක්වාන්ග් ඩක් නාහිමිපාණන් වහන්සේ

| | | | |
|---|---|---|---|
| ❑ | උපන් දිනය | : | 1897 |
| ❑ | ගිහි කාලයේ නම | : | ලැම් වැන් තක් (Lam Van Tuc) |
| ❑ | පැවිදි වූයේ | : | වයස අවුරුදු 7 දී |
| ❑ | උපසම්පදා වූයේ | : | වයස අවුරුදු 20 දී |
| ❑ | අපවත් වනවිට වයස | : | අවුරුදු 66 යි |

realitynature@gmail.com



අතිපූජනීය තිච් ක්වන්ග් ඩක් නාහිමිපාණන් වහන්සේ පෙනීසිටි
එකම ඡායාරූපය මෙයයි.



මිනිස් සංවේදනා උඩු යටිකුරු කළ එම සිදුවීම චිත්‍ර ශිල්පියෙකුගේ ඇසින්.

realitynature@gmail.com







තම සිරුර ගිණිදැල්
වෙලාගෙන තිබියදී පවා
දගමයක් හෝ නොසෙල්වී
සිටීම
මෙන්ම, සිහින් කෙඳිරිලි හඬක්
හෝ නිකුත් නොකිරීම
උන්වහන්සේ සතු වූ දමනය
කළ සිත පිළිබඳව සාක්ෂි
සපයයි.

අතිපූජනීය
තිච් ක්වන්ග් ඩක්
නාහිමිපාණන් වහන්සේ
සිරුරට ගිණිතබා ගත්තේ
මෙම වාහනයෙන් ලබාගත්
ඉන්ධන සිය සිරුරට
වත්කර ගැනීමෙන්
අනතුරුවය.



realitynature@gmail.com



ඒ දමනය කළ සිත
ගිණිගෙන දවා අළු කළ නොහැකිවිය

realitynature@gmail.com



ඒ දමනය කළ සිත.. අතැතිව, ගෞරව සම්ප්‍රයුක්තව



දමනය කළ සිතැති, ඒ ශ්‍රේෂ්ට හිමිපාණන් වහන්සේගේ මතකය
අද මෙසේ දිස්වේ.

realitynature@gmail.com



තිච් ක්වන්ග් ඩක් නාහිමිපාණන් සිහිවීම පිණිස
උන්වහන්සේගේ භෂ්මාවශේෂ තැන්පත් කර ඉදිකර ඇති ස්මාරකය

**සම්බුදු රජාණන් වහන්සේගේ දර්ශනය නිවැරදිව අවබෝධ කරගෙන සකළ ලෝක සත්වයාගේ හිතසුව පිණිස සිය අධ්‍යාත්මය මෙහෙයවූ මෙවන් ශ්‍රේෂ්ට හිමිපාණන් වහන්සේලා පිළිබඳ මතකය අප සැමදා සිහිකරමු.**

තොරතුරු ගවේශනය සඳහා


Quang Duc Buddhist Monastery
ACN 002 2333 2V, ABN 83 235 571 574
Address : 105 Lynch Road, Fawkner, Vic.3060 Australia
Tel : 61.03.9357 3544 ; Fax: 61.03.9357 3600
Email :quangduc@quangduc.com
Web : http://www.quangduc.com


ඔබ සතුව මේ සිදුවීම පිළිබඳ තවත් තොරතුරු ඇත්නම් කරුණාකර දන්වන්න
realitynature@gmail.com